සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
சமூகவலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு
MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE

# දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව
# வாழ்வின்எழுச்சி அபிவிருத்தி திணைக்களம்
# Department of Divineguma Development

4වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල.
4வதுமாடி,செத்சிறிபாய பத்தரமுல்ல
4th floor, Sethsiripaya ,Battaramulla

මගේ අංකය
எனதுஇல
My No } DDD/HO/MF/05/02/08
අළුත් අවුරුදු - 2016

ඔබේ අංකය
உமது இல
Your No } ..........

දිනය
திகதி
Date } 2016/04/07

දිවිනැගුම බැංකු චක්‍රලේඛ අංක :- 2016/03ට පළමු එකතුව

දිවිනැගුම ප්‍රජාමූල බැංකු කළමණාකරුවන්
දිවිනැගුම ප්‍රජාමූල බැංකු සමිති කළමණාකරුවන් වෙත,

## "අපේකම රැකගනිමු - සකසුරුවම ඇති කරමු."
## සිංහල/ හින්දු අළුත් අවුරුදු උත්සවයට සමගාමීව, ඉතුරුම් ප්‍රවර්ධන හා
## අළුත් අවුරුදු උත්සව වැඩසටහන - 2016

1. සිංහල/ හින්දු අළුත් අවුරුදු ගණුදෙනු සඳහා බැංකු විවෘත කරනු ලබන්නේ 2016.04.14 දින නොව 2016.04.15 දින වේ. මෙම තීරණය ගනු ලබන්නේ, වෘත්තීය සමිති කිහිපයක් හා බැංකු නිලධාරීන් කරන ලද ඉල්ලීමක් මත එදිනට රැස්වන මුදල් වල ආරක්ෂාව සම්බන්ධයෙන් පැන නැගුනු ගැටළුවක් හේතුවෙනි. මෙම තීරණය වසම් සඳහා ද වලංගු වේ.
2. දැනටමත් ලබාදී ඇති උපදෙස් පරිදි 2016/04/15 දින දේශීය රසකැවිලි වලින් ගණුදෙනුකරුවන්ට සංග්‍රහ කිරීම කල යුතු අතර, රු.10/- කාසියක් තුටු පඬුරක් ලෙස ලබාදීමේ උපදෙස එදිනට වලංගු කරගත යුතුය.
3. ගණුදෙනුකරුවන්ට තිළිණ ලබාදීම.

   3.01. අවුරුදු ගණුදෙනු චාරිත්‍රය හා ඉතුරුම් ප්‍රවර්ධන සතිය තුල දිවිනැගුම ප්‍රජාමූල බැංකුව සමඟ එකතුවන ගණුදෙනුකරුවන්ට පහත පරිදි තිළිණ මිලදී ගෙන ලබාදිය යුතුය.

| මුදල් සීමාව (රු.) | ලබාදෙන තිළිණය | | මිලදී ගත යුතු ආයතනයේ නම | එක් අයිතමයක් සඳහා වැය කල හැකි උපරිම මිල (රු.) |
|---|---|---|---|---|
| | අයිතමය | මෝස්තරය | | |
| රු.100,000 හෝ ඊට වැඩි | මේස විදුලි පංකා | FT 40 – 814 | අබාන්ස් (LG) | 3,589.00 |
| රු.50,000 – 99,999 අතර | විදුලි කේතල් (1.7L) | AB – 9970/1 | අබාන්ස් (LG) | 1,389.00 |
| රු.25,000 – 49,999 අතර | විදුලි ස්ත්‍රික්කය (1000W) | WR 1809B | දිනපාල සමාගම | 1,190.00 |
| රු.10,000 – 24,999 අතර | ආරෝපනය කල හැකි විදුලි පන්දම (9LED) | CTL – SL 013 | දිනපාල සමාගම | 750.00 |
| රු.5,000 – 9,999 අතර | ආරෝපනය කල හැකි විදුලි පන්දම (8LED) | CTL – TH 034 | දිනපාල සමාගම | 515.00 |

අධ්‍යක්ෂ ජනරාල්
பணிப்பாளர் தலைமையதிபதி
Director General
Tel:011-2873802/2872202
Fax -011-2889002
dg@divineguma.gov.lk

අතිරේක අධ්‍යක්ෂජනරාල්
மேலதிகபணிப்பாளர்தலைமையதிபதி
Additional DirectorGeneral
011-2871672
011-2887280
adg@divineguma.gov.lk

අධ්‍යක්ෂ (පාලන)
பணிப்பாளர்(நிர்வாகம்)
Director (Administration)
011-2873799
011-2873996
diradmin@divineguma.gov.lk

ප්‍රධාන ගණකාධිකාරී
பிரதான கணக்காளர்
Chief Accountant
011-2869742
011-2869742
finance@divineguma.gov.lk

කාර්යාලය
அலுவலகம்
Office
011-2887280
011- 2887722(Hotline)
Isuri-desktop-Anura-Circular-බැංකු විවෘත කි.

3.02. රු.4,999ට අඩු තැන්පතු මුදලක් සඳහා රු.250 නොඉක්මවන තිළිණයක් ලබාදිය යුතුය. එම තිළිණ වෙළඳපොලෙන් මිලදී ගත හැකි අතර, එහිදී සමෘද්ධි ව්‍යවසායකයින්ගේ නිෂ්පාදන තිළිණ ලෙස ලබාදීමට විශේෂත්වයක් දැක්විය හැක.

3.03. ළමා ගිණුම් සඳහා මුදල් තැන්පත් කරන ගිණුම් හිමියන්ට පහත තිළිණ වෙළඳපොලෙන් මිලදී ගෙන ලබාදිය යුතුය.

| තැන්පතු මුදල් පරාසය (රු.) | තිළිණය | වැය කල යුතු උපරිම මුදල (රු.) |
|---|---|---|
| රු.5,000 හෝ ඊට වැඩි | කවකටු පෙට්ටියක් | 300.00 |
| රු.2,500 – 4,999 අතර | පාසැල් වතුර බෝතලයක් | 200.00 |
| රු.1,000 – 2,499 අතර | පෝසිලින් කෝප්පයක් (Mug) | 150.00 |
| රු.1,000 ට අඩු | මුදල් කැටයක් | 50.00 |

ගිණුම් හිමියාගේ වයස අනුව අදාල උපරිම මුදල ඇතුලත සුදුසු වෙනත් තිළිණයක් ලබාදීමට ඉඩදෙනු ලැබේ.

4. ඡේද අංක 03 සඳහන් පරිදි, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු මගින් තීර්ණයක් කර ඇති භාණ්ඩය හා වර්ගය සඳහන් කර ඇති අයිතමය මිලදී ගත යුත්තේ, නම් කර ඇති ආයතනයෙන් පමණක් වේ. එම තැන්පතු මුදල් සඳහා වෙනත් තිළිණ ලබාදිය නොහැක. එම භාණ්ඩ අදාල නම් කර ඇති ආයතනයේ ප්‍රධාන කාර්යාලය/ ප්‍රාදේශීය ශාඛාව/ හෝ නියෝජිත ආයතනයකින් ඇනවුම් කර මිලදී ගැනීම් කර ගත යුතුය. මෙම ආයතන සම්බන්ධ පහත දුරකථන අංක සමගින් සම්බන්ධ කරගෙන වැඩි විස්තර ලබාගත හැක.

| | | | | |
|---|---|---|---|---|
| අබාන්ස් ආයතනය | - | තරින්දු | - | 072-3108062 / 011-4512440 |
| දිනපාල සමාගම | - | පියල් | - | 077-7395978 / 081-2233839 |

5. ගිණුම් හිමියන් මුදල් තැන්පත් කරන අවස්ථාවේදී තිළිණ ලබාදීමට සුදුසු වැඩ පිළිවෙලක් සකස් කර ගැනීම වඩාත් සුදුසු වන අතර, භාණ්ඩ ඇණවුම් කිරීමේ ප්‍රමාදයක් පවතින විට ගිණුම් හිමියන්ට අදාල තිළිණය ඉදිරි දිනයක ලබාදෙන බවට සහතිකයක් ලබාදීමට සුදුසු වැඩ පිළිවෙලක් සකස් කරගත යුතුය.

6. අවුරුදු ඉතුරුම් ප්‍රවර්ධන සතිය තුල ක්ෂේත්‍රයේදී රැස් කරන තැන්පතු මුදල් 2016.04.22 දිනය තුලද බැංකුව විසින් භාර ගැනීම කල යුතුය. ඉන් අනතුරුව බැංකු ගත කරන තැන්පතු මුදල් ඉලක්ක සඳහා වලංගු නොවේ.

7. අවුරුදු උත්සවය පැවැත්වීම සඳහා වියදම් දැරීමේදී බැංකුව සඳහා ලබාදී ඇති රු.මි. 1.0 ඉලක්කය සහ අවුරුදු උත්සවය පැවැත්වෙන දිනය යන කරුණු 01 හෝ 02 සම්පූර්ණ නොවන අවස්ථාවකදී දැරිය හැකි වියදම රු.25,000 යන කොන්දේසිය අයත් ඡේද අංක 4.6 අවලංගු කරන අතර, එම අවස්ථාවකදී වුවද දැරිය හැකි උපරිම මුදල රු.40,000 ක් බැංකු වියදමක් ලෙස ගිණුම් ගත කල යුතුය.

**චන්ද්‍රා වික්‍රමසිංහ,**

**අධ්‍යක්ෂ ජනරාල්**

**ඩී.ඒ.සුනන්දා පියසීලි,**

**අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)**

**පිටපත් :-**

| | | |
|---|---|---|
| 01. ලේකම්, සමාජ සවිබල ගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය | - | කා.දැ.ස. |
| 02. සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් | - | කා.දැ.ස. |
| 03. සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් | - | කා.දැ.ස. |
| 04. සියළුම දිස්ත්‍රික් දිවිනැගුම අධ්‍යක්ෂවරුන් | - | කා.දැ.ස. |
| 05. ප්‍රධාන අභ්‍යන්තර විගණක, දිවිනැගුම සංවර්ධන දෙපාර්තමේන්තුව | - | කා.දැ.ස |